

# පැළෑටි පෝෂණයේ මූලධර්ම හා පොහොර පාවිච්චිය

මූල ද්‍රව්‍යය—පැවැත්වීමට හා වැඩීමටද, රසායනික මූලද්‍රව්‍ය ගණනාවක් පැළෑටිවලට අවශ්‍ය වෙති. මෙයින් විශාල වශයෙන් අවශ්‍ය වන ද්‍රව්‍යයන් අතර (Sulphur) ගෙන්දගම්, මැග්නීසියම්, චූර්ණකර, (Calcium), යවක්ෂාර, (Potassium) ප්‍රකාශද (Phosphorus), ජීවාන්තක (Nitrogen), අම්ලකර (Oxygen), ජලකර (Hydrogen) හා කාබන් වෙති. පැළෑටියට සුළු වශයෙන් අවශ්‍ය ද්‍රව්‍යයන් අතර ක්ලෝරීන්, බෝරෝන්, මොලිබ්ඩනම්, මැන්


ආචාර්ය

**එෆ්. එස්. සී. පී. කල්පගේ**

ලංකා විශ්ව විද්‍යාලය.


ගනීස්, තුත්තනාගම් (සින්ක්), තඹ (Zinc), හා යකඩ (Iron) ආදිය වෙති. මෙම මූල ද්‍රව්‍යයන්ගෙන් කාබන් හා අම්ලකර පැළෑටිවල අවට ඇති වාතයෙන්ද, ජලකර හා අම්ලකර වැඩි වශයෙන් පසේ ඇති ජලයෙන්ද, සාමාන්‍ය ප්‍රමාණයක් පැළෑටි අවට ඇති සුළිඟින් ද ඇද ගනී. අනිකුත් පැළෑටි වලට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ සම්පූර්ණයෙන්ම වාගේ පසෙන් ඇද ගනී.

**පැළෑටිවල පෝෂණයේ මූලද්‍රව්‍ය වලින් කෙරෙන වැඩ**

අයන වශයෙන් පසේ ඇති රස පෝෂ්‍ය පදාර්ථ, පැළෑටි මුල්වලින් පැළෑටි තුළට ඇද ගනී. මෙම අයන (Ions) පැළෑටිය තුළ ඉන්පසු අවශ්‍ය ද්‍රව්‍ය වලට පරිවර්තනය වෙයි. පැළෑටි පෝෂණය කරණ අයන පැළෑටිතුළට ඇද ගැනීම රඳා පවතින්නේ පැළෑටියට හා පසට බලපාන කරුණු කීපයක් නිසාය. ඌනතා රෝග වලින් පැළෑටි පෙළෙන්නේ, පැළෑටි පෝෂණය කරන අයන අවශ්‍ය ප්‍රමාණයන් පැළෑටිවලට ලබා ගැනීමට නුපුළුවන් වූ විටය. එයින් බෝග නිසියාකාර නොවැඩෙන අතර, අස්වැන්නද අඩුවී ගොස් පැළෑටි මරණයට පත් වන අවස්ථාද ඇත. පෝෂ්‍ය පදාර්ථ ඌනතාවයෙන් ඇති වන රෝගවලට ආවේණික වූ රෝග ලක්ෂණ ඇත.

නොවැඩුණු මිටි පැළෑටිවලින් ඒකාකාර ලා කහ පාට අතු පතරින් ද, පැළෑටි ජීවාන්තක ඌනතාවයෙන් පෙළෙන බැව් පැහැදිළි වෙයි. කුඩාවට වැඩුණු පත්‍ර හා දඹු කොළරතු, රතට හුරු දුඹුරු, දම් හෝ ලෝකඩ වර්ණයෙන් යුක්ත දුර්වලව වැඩුණු මූල පද්ධියක් ඇති පැළෑටි ප්‍රකාශ ද අඩු කමින් පෙළෙති. මෙවැනි ගස්වල මල් පිපීම හා ගෙඩි පැසීමට කල් ගත වන අතර මෙම ගස් වල

වැඩෙන ගෙඩි හා ඇට කුඩාය. ගස්වල මෙරු කොළවල දාර හා අගිස් කහවන්වීම එම ගස් යවකෂාර ඌනතාවයෙන් පෙළෙන බවට ලකුණකි. ඉන් පසු මෙම කහවන්වීම පත්‍ර වල නැටිය ඇති පෙදෙසට හා දළුවලට ද පැතිරී යයි. මෙම කහ පාට පෙදෙස් ඉන් පසු වියලී මැරී යයි. සමහර විට මෙම ස්ථාන රතු, දුඹුරු, හෝ දුඹුරු ගුරුපාට වූ අවස්ථා ද ඇත. අවශ්‍ය මූල ද්‍රව්‍යය මඳ වූ බැවින් ගස තුළ ඇති සාමාන්‍ය ක්‍රියාකාරිත්වය නිසියාකාර ඇති නොවන බැවින් ඌනතාවයෙන් ඇති වන රෝග ලක්ෂණ මතුවෙයි. පැළෑටියේ හරිත්‍රපද (Chlorophyll) සෑදීමට ඉතාමත්ම අවශ්‍ය වන්නේ ජීවාන්තකයි. ප්‍රකාශද අම්ලය පැළෑටිය තුළ ඇති එන්සයිම්වල ක්‍රියා කාරිත්වය ඇති කරයි. බොහෝ පරිවෘතික ක්‍රියාවන් (Metabolic Activities) ක්‍රියාත්මක වන්නේ ප්‍රකාශද නිසාය.

**පොහොර පාවිච්චිය.**—ස්වාභාවික තත්ත්වයන් යටතේ පෝෂණයට අවශ්‍ය මූල ද්‍රව්‍ය පසත්, වෘක්ෂලතාදියත් අතර එහා මෙහා ගමන් කරණ අතරම, අවසානයේදී සමතුළනිතාවයක් (Equili brium) ඇති වෙයි. ගොවි කටයුතු නිසා මෙම සමතුළිනතාවය නැති වෙයි. වගා කරණ බෝග වර්ග ස්වාභාවික වශයෙන් එම පරිසරයේ නොමැති අතර, නෙලාගත් අස්වැන්නට අයත් පැළෑටි කොටස් පරිභෝග කිරීම උදෙසා දුර බැහැර පළාත්වලට ගෙනයනු ලැබේ. එවිට, පොළොවේ ඇති රස ආහාර ප්‍රමාණය වැඩෙන බෝගයට මදි වෙයි. පසේ පැළෑටි වැඩීමට අවශ්‍ය ද්‍රව්‍ය රසායනික පොහොර හා ෛජව්‍ය පොහොර වශයෙන් යෙදීමට සිදු වන්නේ එවිටය.

### රසායනික පොහොර

ස්වාභාවික ලෙස සොයා ගත් ද්‍රව්‍යවලින් හෝ නිෂ්පාදිත ද්‍රව්‍යයක් වශයෙන් හෝ නිපැදවෙන රසායනික ද්‍රව්‍යවල අකාබනික ස්වාභාවයක් ඇත. රසායනික පොහොර ගණයට අයත් යූරියා හා සයනමයිඩ් ඇත්ත වශයෙන්ම කාබනික රසායනික ද්‍රව්‍යයන්ය. අනිකුත් පොහොර වර්ග කාබනික ද්‍රව්‍යයන් වන අතර, ඒවාට ෛජව්‍ය පොහොර යයි කියනු ලැබේ. රසායනික පොහොර වල කාබනික ද්‍රව්‍යයක් වන යූරියා ඇතුවා මෙන්ම මියුරියේට් ඔෆ් පොටෑශ් හා සෝඩියම් නයිට්රේට්, ලෝකයේ නොයෙක් ස්ථානවල ස්වාභාවික වශයෙන් පොළොවේ යට තැන්පත් වී තිබීම අස්වාභාවික කරුණක් නොවේ.

ජීවාන්තක, ප්‍රකාශද හා යවාකෂාර ජී.ප්‍ර.ය (N: P: k) සපයන මූල ද්‍රව්‍ය රසායනික පොහොර වර්ග වෙති. හුණුවල කැල්සියම් හා මැග්නීසියම් වැනි ද්‍රව්‍ය ඇත. ජී.ප්‍ර.ය. (N: P: k) පොහොර මිශ්‍රණවල අඩංගු ද්‍රව්‍යයක් වශයෙන් ගෙන්දගම් ඇතුළත් කොට ඇත. අවශ්‍ය අවස්ථාවලදී පොහොර මිශ්‍රණවලට අංශුමාත්‍ර මූල ද්‍රව්‍ය (Trace Elements) එකතු කළ හැක.

### හඳුන්වන ක්‍රම

ජීවාන්තක සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ N අකුරෙනි. ප්‍රකාශද හඳුන්වනු ලබන්නේ ෆොස්ෆරික් අම්ලය ($P_2O_5$) වශයෙන් හඳුන්වන අතර, යවකෂාර හඳුන්වනු ලබන්නේ පොටෑශ් ($k_2O_5$) වශයෙනි. එහෙත් අකුරෙන් හඳුන්වන ජීවාන්තක මූල ද්‍රව්‍ය වායුවක් බැවි බොහෝ දෙනා දනිති. පොටෑසියම් ඔක්සයිඩ් හා ෆොස්ෆරස් පෙන්ටොක් සයිඩ් සාමාන්‍යයෙන් සමු නොවන ක්‍රියාකාරී වන සාමාන්‍යයෙන් දකින්නට නොලැබෙන ඝන ද්‍රව්‍ය වෙති. පොහොරවල තත්ත්වය දක්වන කල්හී රසායනික පොහොරවල ඇති ජීවාන්තක ප්‍රමාණය දක්වන්නේ (නයිට්‍රෝජන්) සියයට ප්‍රමාණයෙනි. ප්‍රකාශද දක්වන්නේ ජලයෙහි දියවන හෝ සිට්‍රේට්වල දියවන ෆොස්ෆරික් අම්ල ($P_2O_5$) ප්‍රමාණයෙනි. පොටෑසියම් ප්‍රමාණය දන්වන්නේ ජලයෙහි දියවන පොටෑශ් ($k_2O$) සියයට ප්‍රමාණයෙනි. එබැවින් රසායනික පොහොර මිශ්‍රණයක් 5 — 10 — 5 වශයෙන් හඳුන්වයිනම් එයින් කියැවෙන්නේ ජීවාන්තක (N) සියයට 5 ක් ඇති බැවි හා ෆොස්ෆරික් අම්ලය ($P_2O_5$) සියයට 10 ක් ඇති බැවි හා ජලයෙහි දියවන පොටෑශ් සියයට 5ක් ඇති බැවි ය. එහෙත් රසායනික පොහොර මිශ්‍රණය අනුපාත වශයෙන් දක්වන්නේ නම්, 1 – 2 – 1 අනුපාතය, 4 – 8 – 4 අනුපාතය වශයෙන් දැක්විය හැකිය.

### රසායනික පොහොරවල මිළ

නොයෙක් රසායනික පොහොර වර්ගවල මිළ ගණන් සාමාන්‍යයෙන් සසඳනු ලබන්නේ ඒකක ක්‍රමයටයි. රසායනික පොහොරවල ඇති ක්‍රියාකාරී ද්‍රව්‍යයෙන් සියයට ගණනින් පොහොර ටොන් එකක මිළ බෙදූ විට ඒකකයක මිළ ලැබේ. උදාහරණයක් වශයෙන් සියයට 21 ක් ජීවාන්තක ඇති ඇමෝනියම් සල්ෆේට් වල ටොන් එකක් රු. 330 ක් වුවොත් ඒකකයක මිළ 330/20 = 15.7

ක් වෙයි. සියයට 46 ක් ජීවාන්තක ඇති යූරියා ටොන් එකක් රු. 580 ක් වූවොත් ඒකකයක මිළ 12.6 කි.

### ලංකාවේ සාමාන්‍යයෙන් පාවිච්චි කරණ රසායනික පොහොර වර්ග

ලංකාවේ වැඩි වශයෙන්ම පාවිච්චි කෙරෙන රසායනික පොහොර නම් එමෝනියම් සල්ෆේට්, සැපොස්ෆොස්පේට්, සුපර්ෆොස්ෆේට් හා මියුරියේට් ඔෆ් පොටෑශ් වෙයි. 1962 ලංකාවට ආනයනය කරණ ලද රසායනික පොහොර වලින් සියයට 94.4 ක් ඉහත කී රසායනික පොහොර වර්ගවලට සීමා විය. වී වගාවට වැඩි වැඩියෙන් යූරියා හා ඇමෝනියම් ෆොස්පේට් දැන් නිර්දේශ කෙරෙන අතර, ඉක්මණින් ප්‍රතිඵල ලබා ගැනීමට සෝඩියම් නයිට්රේට් උපයෝගී කර ගනු ලැබේ. මියුරියේට් ඔෆ් පොටෑශ් වලට වඩා පොටෑසියම් සල්ෆේට් වඩා මිළ වුවද, සල්ෆේට් ඔෆ් පොටෑශ් සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන්නේ සමහර බෝග වලට ක්ලෝරයිඩ් අයනය විෂවන අවස්ථාවලදීය. උදා : (දුම්කොළ).

ලංකාවේ වගාවලට රසායනික පොහොර යෙදීමේදී එමෝනියම් සල්ෆේට් වෙනුවට යූරියා කොතෙක් දුරට පාවිච්චි කළ හැකිවේද යන්නට ස්ථිර උත්තරයක් තවම ලැබී නැත. යෝජනා කර ඇති ජීවාන්තක රසායනික පොහොර නිශ්පාදනය කිරීමේ කම්හලෙහි එමෝනියම්සල්ෆේට් පමණක් හෝ එමෝනියම් සල්ෆේට් හා යූරියා යන දෙවර්ගයම සෑහෙන අනුපාතයකට නිශ්පාදනය කිරීමට යෝජනා කර ඇත. කෙසේ වෙතත් එමෝනියම් සල්ෆේට් නිශ්පාදනය කිරීමට අවශ්‍ය අමු ද්‍රව්‍යයක් වන ගෙන්දගම් අවුරුද්දකට ටොන් 40,000 ක් පමණ අතිරේක විදේශ විනිමය රු. 60 ලක්ෂයක් වියදමින් රටතුලට ගෙන්වන්නට සිදු වෙයි.

### රසායනික පොහොර යෙදීම

ආර්ථික කරුණු මෙන්ම බෝගවලට යොදන වගාක්‍රමද, දේශගුණය පැළෑටි වර්ගයද, පස, ආදී කරුණු කීපයක් නිසා එක් එක් බෝගයට පොහොර යොදන වේලාව හා ප්‍රමාණය ද වෙනස් වෙයි. තවද පසට පොහොර දැමීමට පෙර පසේ රසද්‍රව්‍ය තිබෙන මට්ටම, පැළෑටිවලට ඇද ගත හැකි ප්‍රමාණය හා ඓන්ද්‍රිය පොහොර ඇති ප්‍රමාණය, ආදීය පිළිබඳ කල්පනා කළ යුතුය. බොහෝ පෝෂ්‍ය මූල ද්‍රව්‍ය උරා ගත හැකි හා පසේ ඇති ප්‍රමාණයන්, විශේෂයෙන්ම, ප්‍රකාශද හා අංශුමාත්‍ර මූල ද්‍රව්‍යයන් ප්‍රමාණය රඳා පවතින්නේ පසේ ඇඹුල් ප්‍රමාණය උඩය. බොහෝ රස ද්‍රව්‍ය වල බලය හා පැලෑටි වලට ගත හැකි ප්‍රමාණයන් රඳා පවතින්නේ ඇඹුල් ගතිය නොහොත් පසේ පී. එච්. අගය 6–7 දක්වා ඇති කාලයටය. දෙවන චක්‍රයෙන් එක් එක් බෝග වර්ගවලට රසායනික මූල ද්‍රව්‍ය අවශ්‍ය වන ආකාරය පෙන්වා දෙයි. පැළෑටිවල පෝෂ්‍ය පදාර්ථ අවශ්‍යතාවයන් පැළෑටි පෝෂ්‍ය පදාර්ථ උරා ගන්නා ප්‍රමාණයට සමාන නොවේ. එබැවින් යොදන රසායනික පොහොර පොළොව තුළට කිඳා බැසීම උපයෝගී කරණය (Fixation) හෝ වාශ්පීකරනය (Volatalize) හෝ සිදු වෙයි. සහජීවී බැක්ටීරියා (Symbiolic Bateria) වල ආධාරය ඇතිව සුළඟේ ඇති ජීවාන්තක වායුව ජීවාන්තක බොහෝ සෙයින් ලබා ගන්නා රනිල බෝගවලට ලබා ගත හැක.

පෝෂ්‍ය පදාර්ථ ස්ථිර ප්‍රමාණයන් පැළෑටිවලට අවශ්‍ය වන, වැඩීමේ කාල සීමාවන් දැනගැනීම අවශ්‍ය වෙයි. පැළෑටිවල වැඩීමේ පිළිවෙල පිළිබඳව කායික විද්‍යාත්මක අධ්‍යායනය මගින් මෙම තොරතුරු ලබා ගත හැක.

බෝග වර්ග හා රසායනික පොහොර අතර අන්‍යොන්‍ය බලපැවැත්ම මෙහි ඉතා වැදගත් සාධකයකි. ඇද වැටීමේ අනතුරට භාජනය නොවනසේ, බොහෝ රසායනික පොහොර වැඩියෙන් ශක්තිමත් දඬු ඇති, වී වර්ගවලට යෙදිය හැක. වර්ෂාපතනය, උෂ්ණත්වය, සූර්‍යාතාපය, ආදිය පැළෑටියක වැඩීමට බලපාන අතර, රසායනික පොහොර දැමීමේ ප්‍රමාණය ද, මෙම කරුණු මත රඳා පවතී. රසායනික පොහොර පාවිච්චියේ ආකාරය, ශෂ්‍ය මාරු කිරීමේ ක්‍රම, පැළෑටි අතර පරතරය, වල් පැළ හා ලෙඩරෝග වැළැක්වීමේ ක්‍රම වැනි රෝපන ක්‍රම මත රඳා පවතී.

### රසායනික පොහොර යොදන ප්‍රමාණයන්

බෝගවලට රසායනික පොහොර දැමීමේ එක් අරමුණක් අස්වැන්න වැඩි කිරීම බැවින් බෝගයකට රසායනික පොහොර දැමීමෙන් ලබා ගත හැකි උපරිම අස්වැන්න ප්‍රමාණය කොතෙක්දැයි දැන ගැනීම වැදගත්ය. පළමුවන චක්‍රයේ රසායනික පොහොර ප්‍රතිචාර චක්‍රයන්ගෙන් රසායනික පොහොර වැඩියෙන් යොදන කල්හි අස්වැන්න වෙනස් වන අන්දම විදහා පායි. රසායනික පොහොර දැමිය යුතු ප්‍රශස්ථ (Optimum) ප්‍රමාණය රඳා පවතින්නේ රසායනික පොහොරවල මිළ හා කෘෂිකාර්මික නිෂ්පාදිතයට ලැබෙන

ඵල ගණන් අනුවය. පැළෑටිවලට යෙදිය යුතු විශෂ්ඨ රසායනික පොහොර ප්‍රමාණය සීමාවන්නේ වෘද්ධියෙන් නිෂ්පාදනය වන ද්‍රව්‍යය විකුණා ලබන මිදලට වඩා වැඩි මුදලක් එම වැඩි අස්වැන්න නිෂ්පාදනය කිරීමට වියදම් වන අවස්ථාවන්හීය. දෙවැනි චක්‍රයෙන් මෙය පැහැදිළි වෙයි.

**රසායනික පොහොර යොදන වේලාව හා කාලය**

පොහොර පසෙන් ඇද ගන්නා නියත කාල සීමා වන් ඇති පසේ පෝෂ්‍ය පදාර්ථ අඩුවෙන් ඇති විට නියම කලට වේලාවට පෝෂ්‍ය පදාර්ථ පැළවලට සැපයීම විශේෂයෙන්ම වැදගත් වෙයි. මේ පිළි බඳව සාමාන්‍ය නීතියක් ගෙන හැර පෑමට බැරි වන්නේ එක් එක් පෝෂ්‍ය පදාර්ථවලින් පැළය තුළ කෙරෙන වැඩ විවිධ වන අතර එක අවස්ථා වෙහිම පොහොර අවශ්‍ය නොවන බැවිනි. තවද, එක් එක් පොහොර වර්ග පස තුළ එහා මෙහා යන පිළිවෙළද වෙනස්වෙයි. ජීවාන්තක පොහොර සාමාන්‍යයෙන් යොදනු ලබන්නේ, පැළෑටි වැඩෙන අවස්ථාවේ පසේ මතුපිටටය. ප්‍රකාශද ඇති රසායනික පොහොර පැළ සිටුවීමට හෝ ඇට සිටුවීමට පෙර වගා කරණ පසට කලවම් කරණ අතර යවක්ෂාර ඉහත කී දෙවිධියටම සාමාන්‍යයෙන් යෙදේ.

රසායනික පොහොර යෙදීමේ පැහැදිළි ක්‍රම තුනක් ඇත. පොහොර වැපිරීම (Broadcasting) පොහොර තැන්පත් කිරීම (Placement) හා පොහොර ජලයේ දිය කොට ඉසීම (Spraying) ඒ ක්‍රම තුන වෙති. මෙම ක්‍රම සම්පාදනය කොට ඇත්තේ රසායනික පොහොරවල උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහාය. එකිනෙකට ඉතා ලං ලංව වැඩෙන, ඉඩමේ සෑම තැනම මුල් විශාල ප්‍රමාණයක් විහිදී ගිය, බෝගවලට, පොහොර වැපිරීම සාමාන්‍යයෙන් කරනු ලැබේ. දුරින් වැඩෙන මුල් පවා නිසියාකාර නොවැඩී ඇති, පොහොර උපයෝගී කරනය (Fixation) වීය හැකි, සුළු පොහොර ප්‍රමාණයක් අවශ්‍ය බෝග වලට, පොහොර තැන්පත් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. අනික් ක්‍රමය අනුව, පසට දමන පොහොර පැළෑටිවලට නොලැබී යන ද්‍රව්‍යවලට පරිවර්තනය වන අවස්ථාවලදී විශේෂයෙන්ම අංශුමාත්‍ර මූල ද්‍රව්‍ය යොදනු ලබන්නේ ජලයෙන් දියකොට බෝග මතට ඉසීමෙනි.

**(ට්‍රොපිකල් ඇග්රිකල්චරිස්ට සඟරාවෙනි)**

**1 වන චක්‍රය—ලංකාවේ පාවිච්චි කරණ සමහර පොහොර වර්ග**

| පොහොර වර්ගය | සාමාන්‍ය සංයුතිය සියයට ගණන | | | ටොන් එකක මිළ | ඒකක මිළ |
|---|---|---|---|---|---|
| | ජීවාන්තක | ප්‍රකාශද | යවක්ෂාර | | |
| එමෝනියම් සල්ෆේට් | 21 | — | — | 330 | 15.7 |
| චිලිසොල්ට්පීටර් (සෝඩියම් නයිට්රේට්) | 16 | — | — | 520 | 32.5 |
| යූරියා | 46 | — | — | 580 | 12.6 |
| කැල්සියම් සයනමයිඩ් | 20.6 | — | — | 590 | 28.6 |
| එමෝනියම් නයිට්රේට් | 35 | — | — | 650 | 18.6 |
| එමෝනියම් ෆොස්පේට් | 16 | 20 | — | 595 | 16.5 |
| සුපර්ෆොස්පේට් | — | 18 | — | 310 | 17.2 |
| සැර වැඩි සුපර්ෆොස්පේට් | — | 42 | — | 525 | 12.5 |
| සැෆොස්පොස්ෆේට් | — | 29.5 | — | 260 | 8.8 |
| සල්ෆේට් ඔෆ්පොටෑෂ් | — | — | 48 | 510 | 10.6 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් 50% සැරඇති | — | — | 50 | 385 | 7.7 |
| මියුරියේට් ඔෆ්පොටෑෂ් 60% සැර ඇති | — | — | 60 | 425 | 7.1 |
| බෝන්මීල් | 3 | 22 | — | 400 | 16.0 |
| මාළුකුඩු | 4 | 4 | — | 305 | 38.2 |
| මාළු ගුවානෝ (මල) | 7 | 6 | — | 420 | 32.4 |
| සත්ව පෝර | 7 | 10 | 5 | 500 | 22.8 |
| ලේ පෝර | 11 | — | — | 720 | 65.5 |
| ගොඩිපලේ පෝර | 0.4 | 0.3 | — | — | — |
| කොම්පෝස්ට් පෝර | 0.5 | 0.25 | 0.5 | — | — |

2 වන වක්‍රය—නොයෙක් බෝග වර්ගයන් මගින් පෝෂ්‍ය පදාර්ථ උරාගන්නා අයුරු

| බෝගය | අක්කරයකට අස්වැන්න | ජීවාන්තක අක්කරයකට/රු. | ප්‍රකාශද අක්කරයකට/රු. | යවක්ෂාර අක්කරයකට/රු. |
|---|---|---|---|---|
| වී | ධාන්‍ය හො. 35, පිදුරු හො. 24 | 58 | 18 | 67 |
| තේ | නිපද වූ තේ රාත්තල් 400 | 31 | 4 | 13 |
| පොල් | ගස් 50 | 66 | 28 | 123 |
| රබර් | කිරි රාත්. 350 | 42 | 5 | 19 |
| උක් | දඬු ටොන් 36 | 76 | 54 | 170 |
| කපු | පුළුන් රා. 350, ඇට රා. 800 | 75 | 30 | 78 |
| අන්නාසි | ටොන් 16 | 98 | 27 | 245 |
| දුම්කොළ | ටො 16 | 116 | 36 | 214 |

නිමි.

---

# ගොවිතැන නංවමු

1. පෙරදිග ලෝකයේ මිණි පහනක් — ලෙසට
පරසිදු දිවයිනකි ලක්දිව හැම — දෙසට
එනමුත් අහර නොමැතිව හරිහැටී — කුසට
සිටිනුත් බලා එයි උණු කඳුළැලි — ඇසට

2. පෙරදිග හෙළ රජුන් මෙහි රජ කළ — කාලේ
අඩුවක් වුනේ නැත කිසිදිනකත් — හාලේ
කෑමෙන් පසුව හොඳහැටි බත් කුන් — වේලේ
සිහිවෙයි අදත් පිටරටවත් යැවූ — තාලේ

3. සියල්ලක්ම එකතුව ලක් පුතුන් — විසින්
උදැල්ලක් කරට ගෙන කුඹුරකට — ගොසින්
පිඩැල්ලක් කෙටුවහොත් එඩිතරව — යසින්
මෙවැන්නක් නොවේ අපහට කිසිදු — ලෙසින්

4. ඇලදොළ හෙළි කරමු වැව අමුණුද — බදිමු
වැසිදිය රැකගනිමු එය කුඹුරට — ගනිමු
සරුවට වී වවමු වැඩි අස්වනු — ලබමු
ගොවිතැන රජ කරමු ඉන් ජාතිය — නගමු

5. කම්මැලිකම අතැර හැමදෙන — පිබිදේවා !
හැමබිම් අහලකම ගොවිතැන — සරුවේවා !
එමගින් ජාතියෙහි දියුණුව — ඇතිවේවා !
මේ ලක් පොළව කිරිපැණියෙන් — නැහැවේවා !

කෘෂිකර්ම උපදේශක, ඩී. ඇස්. හපුතන්තිරි.

නිමි.